

# ඉපැරණි ම සුපෙම් ලියවැල
## මාලතී කල්පනා ඇම්බ්‍රෝස්



නින්දෙන් පවා මහවැලි ගං දිය තාල කම් කළ
සුන්දර සිපුම් ඉවසන ගලහ මග දිග තුරු වැල
කන්දක රහස් සවන හන්තාන, පණැති කඳු පෙළ
දුම්බර පවා ඇඩුවා අතිනත් ලිහුණු තැන්වල

අඳුරු මංපෙත් තණ මත, පිනි කැට සෙමින් වැතිරුණ
නුදුරු නාදන් සුසුමකි, හිල්ඩා බිමෙහි දැවටුණ
නුහුරු ආදර පිය ගැට, සරසවි උයන ළඟ නිම වුණ
සොඳුරු කඳු ගැටයක දෙව් මැඳුර කාගෙත් කෙම්බිම

වේදනා ඌලකින්, ජීවිතේ සඳ දිය වස්සන
නෑ හෙනා තරමට, හෙමින් මහවැලිය ගැස්සෙන
පෑදෙනා විට රැයෙක, දිය මත අක්බාර් සිත්තම
පිදුනා වළ ට ඉහළින්, සුන්දර ම අහසක ලස්සන

දෑස් සිය දහසක් ඉම්බ මල් ලිය කම් වැල
වෑස්සුණු ප්‍රේමය ගල් කණු පවා මත් කළ
රාස්සිගෙ අවි රැළි යට, තෙල් බැම්ම කෙළවර
රූස්ස ම සංහිඳ, ඒ ටී ශිල්ප රඟහල

අඩ විතකි කෙටි බිතු මත, ලඹ දෙන මතක අහුරකි
මහපොළ යනු ම සසරක අතර මග හිමිදිරියකි
මිතුරු මතකය ගල් කළ ඉපැරණි පොළොන්නරුවකි
සිංහයෝ උඹ තරමට හිනා ගැස්සූ කෙනෙක් තව නැති

පාරා කාලයේ වනපෙත, පාදා ගනිම් ජීවිතේ හදවත
සිඹිමි දම්*සුදු මල් ගස, සිඹින වංගුව් පතුළත
යාරා ගඟත් පසු කොට පෑරි පෑරී සැරුව මග තොට
පේරාදෙණිය ඔබ වන්, තුංග සුවිසල් ලොවක් තව නැත

boondi.lk

# ගුරු පියාණනි
## සරත් වීරසේකර
කැනඩාව

සරස්වති සමඟින් — හුදකලාවේ
විස්කම් උනා ඔබ ගුරුකම — කලාවේ
නොදැමූ කිසිවිටක දරුවන් — මුලාවේ
ගුත්තිල ඔබයි සිප්කල — තක්සලාවේ

මල් රේණුවේ සිට පරමාණුවට — එහා
හැම දේ ගැනම ඔබ සතුවිය දැනුම — මහා
ඉර, හඳ, ග්‍රහලෝක, තරු පෘතුවියට — එහා
ඇති දේවල් ගැනද දැනගත හැකිය — අහා

එක විෂයක් නොවෙයි විෂයන් හැම — ගේම
ගුරුතුම උනා හද දිනු සිසු — හැමගේම
පාසල් ගියේ සතුටිනි හැම — උදයේම
ඔබ නැති දිනක් උනි නම් සෝකෙකි — බෝම

ඔබ නැත කිසි දිනක පොත පත ගෙන — ආවේ
ෆයිල් කවර නැත හිස් අතිනුයි — ආවේ
පිළිබඳ විෂය ඔබ කල ඒ — වෙලාවේ
විස්තර සිසු මනස තුල ලියෑ — උනාවේ

ඔබ සතු අසීමිත කරුණා — ඉවසීම
ඒ ඒ සිසු දැනුම පිළිබඳ — වැටහීම
වෙන්කර ඔවුන් හට යලි පහදා — දීම
ඔබ පැවසූ ලෙසට එය ගුරු — වගකීම

ඔබගෙන් ශිල්ප කල සිය ගණනක් — දරුවෝ
සෘජයේ ආයතනවල තනතුරු — දැරුවෝ
රට දියුණුවට ඒ අය වෙයි — සහකරුවෝ
ඔබ නම එකතුවෙයි ලිතුවට හෙළ — විරුවෝ

# (නො)තනිය
## දිලිනි ඊරියවල

වැසී ඝන තිමිර පට සඳට මග ඇහිරිලා
හිරුගෙ උණුසුම නැතිව ලොවක් වල්මත් වෙලා
වැහි අඳුර ඒ වගෙයි නොතැවෙන්න බියවෙලා
කියූ හැටි මතක් වෙයි නුඹ හිතට ලංවෙලා

වස්සානෙ සීරුවට වලා පට ඉරනවා
ඒ තුලින් රිංගන්න හිරුත් ඉඟි මරනවා
ගෙතුල පිපි රෝස මල වට බඹරු සරණවා
නුඹ නැතිව තවත් එක් දිනක් ඇස් අරිනවා

පිලිකන්නෙ බලූ පොරේ හැම රෑම ඇහෙනවා
ජනේලය අද්දරින් හුලූ අතුත් වැනෙනවා
හුරුපුරුදු අවතාර දොරකඩින් එබෙනවා
ලොකු දෝනි හංගගෙන මං තනිව නිදනවා

කොහි සිටන් හෝ අපව රකින බව දන්නවා
කුසගිනිත් දැනේදැයි මට නිතර හිතෙනවා
ඒ නිසා අදත් මං බත් වේල බෙදනවා
දෝතින්ම ගෙනගිහින් බුදුහිමිට පුදනවා

# ආවර්ජනා
## ප්‍රේමවංස දසනායක

සෙවනැල්ලක් සේ මා වට දැවටුන
ඔබ ඇසුරෙන් පිරි ඒ යුගයේ
කිසි විටෙකත් මා පිය නැගු මග තොට
තනියක් නොදැනුනි ජීවිතයේ

ඔබ මුව කැලුමින් නෙතු මිණි පහනින්
හිරු දිලිසුනු මා වට වූ ලොවේ
විකසිත කුසුමක් විය ඔබ නිරතුරු
මා නෙත අබියස රැයෙද දෙවේ

ගෙල බැඳි රැහැණින් ගැල බර ඔසවා
කෙම් බිම් සොයමින් දිවි කතරේ
සැරි සරනා ගත සිත සතපා ලු
සිසිලස ඔබ විය නිරන්තරේ

ඉර හඳ ගිලිහී අහස පුරන් වී
කණකොක් හඬ විසිරී ගුවනේ
දිවි ගැල ඇන හිට තනිවිය මා මග
ඔබ නෙත වෙනතක යොමුවූ දිනේ

# කොරියාවේ සිරියාව
## සඳුන් ප්‍රියංකර විතානගේ

දවසකට දෙකකට වරක්
ගුස්පියක් වලියක් ඇදෙන
කඩුපාර පිහිපාර
හුළඟෙ යන
සමගිපුර කියා ඇන්ට්‍රියෙ ලියන
අහල ගම් හතම දත්
කොරියාවට

ඉස්කෝලෙ කට්ටි පැන
රස්තියාදුවේ ඇවිද
පොතක් දෙස ඇහැක් ඇර
නො බලාපු ,පොඩි මල්ලි
දිවා රෑ දෙකම
බාසාව වණපොත් කර
රට විරුවෙකැයි අබිසෙස් ලබා
නික්ම ගිය,
කොරියාවට

ඩොන්ගල් ද කොම්පියුටර් ද
වෙබ් කැම් ද ස්කයිප් තිර මත
මැවි මැවී හිනැහෙමින්
අම්මාගෙ නෙත කඳුළු පිසලෑව
කොරියාවට

හදිසියෙම
ඩොවොන්ඩ මිටි ගණන්
වමතෙහි තබා
පොඩි මල්ලිගේ
දකුණු අත රැගෙන
ගෙදර එව්
කොරියාවට

boondi.lk

# ඉඩදෙන්න
## අතුල විජේවික්‍රම

ජීවිතේ පුරාවට
ඇඳි සිත්තමේ තියෙන
සඳත් - තරුත් වසා
වලාවක් දමන්න,
දවල් - ඉරක් දමා
කොනෙන් තියන්න

# කව්ද කියා දන්නවාද ?

වේදිකාවෙ නැග මොරදෙයි ලෙස — පිස්සා
හුම්, හුම් කියයි හැමදේටම ලෙස — බස්සා
කන්දක් පොරොන්දුව කෙන්දක් දෙන — දස්සා
සුදනා තමන් බව පවසයි ලෙස — ඉස්සා

තනතුරු දරුණු මුන් හරි ඉගෙනුමක් — නැතී
එනමුත් දන්න දේවල් ඔහු නිමක් — නැතී
තම වාසියට පැන එක එක වලට — පැතී
මිනිහෙක් උණත් කිසි මිනිසත් කමක් — නැතී

දස අකුසල් කරයි එනමුත් දෙසයි — බණ
අඟ උඩ ඉඳන් නොදැනෙන ලෙස හපයි — කණ
තමහට එරෙහි වෙන අය හට කරයි — පිණ
හිටියොත් හොඳයි මොහු කව්රුද කියා — දැණ

සුපිරි විසල් වාහන වල — ඉගිලෙනවා
ජනයට අහිතකර දේවල — ගෙන්වනවා
කෝටි ගණන් මුදලින් කප්පම් — කනවා
නරිවාදන් විටෙක පල්ලෙන් — බේරෙනවා

නරියෙකි සිංහ හම පොරවාගෙන — ඉන්නේ
හඬ නගනා විටයි හරිහැටි — හඳුනන්නේ
වැරදුන විටදී සඟයා පාවා — දෙන්නේ
යුතුකම්, ගුණ දහම් ඔහු නැත — හඳුනන්නේ

තලන මල පැණි - පිරුණු කල
හිත හාදකම් මත්වේ...
වෙලෙන කල සව් - ගසට සේ වැල
ඉටු දෙව්යි සිත්වේ...
නැගෙන මුදු රළ - උරණ වූ කල
සියොලඟ ම රත්වේ...
දුර දියඹ නොදැනී ගිය දා
දිවි යාත්‍රා ගිල්වේ...

කලට නිසි වැසි - නොලද සරු පල
නොසරුබව පත්වේ...
විලට බැස රිසි - නෙලා ගනු මල
නිබඳ ජය අත්වේ...
කලට ආ නම් - තියේවි දළ
ගජ ඇතුන් තත්වේ...
සිරුර වැහැරී තෙජස සිඳි දා
නෙත කඳුල තෙත්වේ...

බලන තැන තැන - සතුට පිරි කල
රසඳුනකි ගැලුවේ...
දැවෙන සිත් ගිණි - සිතේ සඟවා
සිනාවන් නැගුවේ...

සොබා දහමට - එරෙහි වූවන්
දුක් කඳුළු හෙළුවේ...
මෙලොව හැරයන දවස එනදා
ගුණ දහම් බැලුවේ...

කල්දෙමුල්ල



# ගස් කැව් ඔට්ටුයි
## අනුෂ්ක තිලකරත්න

හැන්දෑවෙ හතරට
එකා දෙන්නා ඇදෙනවා පාරට
කඩේ බංකුව විකට් එක
බැට්ස්මන් ට වඩා උසයි විකට් එක

අර්ජුනලා අරවින්දලා හෂාන්ලා
යුනුස්ලා අක්‍රම්ලා ඩොනල්ඩ්ලා
වෝන්ලා මුරලිලා සචින්ලා
මේ ඔක්කොම හිටියා අපි එක්ක

ගස් කැව් ඔට්ටුයි
බලූ වත්තට ගියොතින් අවුට්
හුඹහට උඩින් හතරයි
හයක් ගැහුවොත් වීරයෙක්

ලොකු අය්යලා ගේ බෝල්
සැරවැඩියි හැමදාම
වැඩිය එන්නැති පොඩි මල්ලිලා
හැමදාම ලාස්ට් මෑන්

උඹ ඉන්ස්ටෝල් කලාද
ඊ ක්‍රිකට් වර්ල්ඩ් කප්
මරු ග්‍රැපික්ස් ටික මචං
අන්න නියම ගේම් එක

මල්ලි ලා දෙන්නෙක්
කියනවා ඇහුනා බස් එකේ
ඉබේටම සිහිවුනා මට
ගස් කැව් ඔට්ටු වුණ අපේ ක්‍රිකට්

පාරටත් තාර වැටිලා
වටේටම තාප්ප බැඳිලා
ගස් කැව් ඔට්ටු කල පොල් ගස්
ඉඳ හිට බලනවා අපි දිහා

boondi.lk